

මූල්‍ය ස්ථායීතා විවරණය 2025
සංක්ෂිප්ත වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රකාශනය:

ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව

විමසීම්, අදහස් සහ ප්‍රතිචාර සඳහා:

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01
විද්‍යුත් ලිපිනය : msd@cbsl.lk

මූල්‍ය ස්ථායීතා විවරණය 2025

සංක්ෂිප්ත වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුව

පටුන

සමස්ත නිරීක්ෂණ 1

සාර්ව මූල්‍ය තත්ත්වයන් 1

මූල්‍ය වෙළඳපොළ 2

මූල්‍ය ආයතන 4

කුටුම්බ සහ සමාගම් අංශය 7

මූල්‍ය ස්ථායිතාව සඳහා ප්‍රතිපත්ති 8

    සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති 8

    මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රතිපත්ති 8

සමස්ත නිරීක්ෂණ

ගෝලීය අවිනිශ්චිතතාවය ඉහළ යෑම සහ මෑත කාලයේ මුහුණ දුන් ආර්ථික අර්බුදයේ බලපෑම් මධ්‍යයේ වුව ද 2025 වසරේ පළමු භාගයේ දී මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව වර්ධනය වූ අතර දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන්හි හිතකර ප්‍රවණතා මෙන්ම ශක්තිමත් මූල්‍ය ආයතන පැවතීම ද ඊට දායක විය. 2025 වසරේ පළමු භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමඟ මූල්‍ය ආයතන ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර මහ බැංකුව විසින් ඵලදායීව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ද සහාය ඇතිව මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යසාධන දර්ශකවල වැඩිදියුණු වීමක් පෙන්නුම් කළේය. සලකා බලනු ලබන කාල පරිච්ඡේදයේ දී මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය ද පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව වැඩිදියුණු වීමක් පෙන්නුම් කළේය. මේ අතර, කුටුම්බ සහ ආයතනික අංශයේ ශේෂ පත්‍ර මත පැවති පීඩනය ලිහිල් වීම ආරම්භ වූ අතර, 2025 වසරේ පළමු භාගයේ දී ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල සමස්ත කාර්යසාධනයේ වර්ධනයක් වාර්තා විය. ණය චක්‍රය ප්‍රසාරණය වීමත් සමඟ, මතුවන කුමන හෝ අවදානම්වලට මුහුණ දීමට හැකිවන අයුරින් මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සාර්ව සහ ක්ෂුද්‍ර විචක්ෂණශීලී ප්‍රතිපත්ති රාමු තවදුරටත් ශක්තිමත් කළ යුතු වේ.

සාර්ව මූල්‍ය තත්ත්වයන්

ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම මධ්‍යයේ වුවද, 2025 වසරේ පළමු භාගයේ දී මූල්‍ය අංශයේ සමස්ත ස්ථායීතාව ඉහළ යෑම සඳහා දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්ගේ අඛණ්ඩ වර්ධනය සහාය විය. දේශීය වශයෙන් ගත් කළ, ලිහිල් මුදල් ප්‍රතිපත්ති, ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම සහ සුභවාදී ව්‍යාපාරික අපේක්ෂාවන් හේතුවෙන් 2025 වසරේ පළමු භාගයේ දී ණය වර්ධනය ඉහළ ගියේය. මේ අතර, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය සහ එහි දිගු කාලීන ප්‍රවණතාව අතර පරතරය අඛණ්ඩව පුළුල් වීම මගින් ණය චක්‍රය අඛණ්ඩව ප්‍රසාරණය වීම පෙන්නුම් කළ අතර එමගින් පද්ධතිමය අවදානම් ඇතිවීම අඛණ්ඩව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි. කෙසේ වෙතත්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය, අර්බුදයට පෙර මට්ටම්වලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි. බැංකු අංශය විසින් ලබා දුන් ණය සහ ලබා ගත් තැන්පතු අතර අනුපාතයෙන් පිළිබිඹු වන, මූල්‍ය අතරමැදිකරණය, මීට පෙර පහත වැටුණු අතර බැංකු ණය ලබා දීම සඳහා දැක්වූ ඉහළ කැමැත්ත සහ ව්‍යාපාරවල ණය ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් එය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. තවද, ඵලදායී මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යෑම පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික පහළ මට්ටම්වල ස්ථායීව පැවතුණි. ආර්ථික නිමැවුම් අඛණ්ඩව වර්ධනය වීම සහ පහළ ගිය මිල මට්ටම් සමඟ කුටුම්බ සහ ආයතනික අංශයේ ශේෂ පත්‍ර මත පැවති පීඩනය ලිහිල් වීම, මූල්‍ය ආයතනයන්හි ණයවල ගුණාත්මකභාවය වර්ධනය වීම සඳහා සහාය විය. ඉහළ රාජ්‍ය ආදායම්වල සහායෙන් සමස්ත අයවැය හිඟයේ අඩුවීමක් ද ප්‍රාථමික ශේෂයෙහි අතිරික්තයක් ද වාර්තා කරමින් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ද ශක්තිමත් වූ අතර එය මූල්‍ය ස්ථායීතාව කෙරෙහි දායක විය. ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් සැලකිය යුතු

රූප සටහන 1
බැංකු සහ මුදල් සමාගම්වල ණය වර්ධනය



මුදල් සමාගම් අංශයේ ණය
බැංකු අංශයේ ණය
බැංකු සහ මුදල් සමාගම්වල ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, දකුණු අක්ෂය)

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2
පෞද්ගලික අංශයේ ණය චක්‍රය*



පෞද්ගලික අංශයේ ණය පරතරය (දකුණු අක්ෂය)
ද.දේ.නි.යේ. ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය
ද.දේ.නි.යේ. ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය ප්‍රවණතාව

* මුදල් සමීක්ෂණයෙන් ලබාගත් ණය සම්බන්ධ දත්ත (පුළුල් මුදල්)

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අභියෝග එල්ල වුවද ආනයන ඉහළ යෑම මධ්‍යයේ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත්ව පැවතුණි.

අඛණ්ඩව පවතින වෙළඳ ආතතීන්, තීරුබදු සංශෝධන සහ පවතින භූ දේශපාලනික ගැටුම් ආයෝජක විශ්වාසයට බලපෑම් ඇති කරමින් ගෝලීය ආර්ථිකය තුළ සැලකිය යුතු අවිනිශ්චිතතාවක් නිර්මාණය වී ඇති අතර එමගින් ගෝලීය සැපයුම් දාම බිඳ වැටීමේ අවදානම ඉහළ ගොස් ඇත. ගෝලීය ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇතත් පවතින අභියෝග හේතුවෙන් එය වසංගත තත්ත්වයට පෙර පැවති සාමාන්‍ය අගයට වඩා පහළ මට්ටමක පවතී. ගෝලීය වෙළඳ සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් අසමාන මට්ටමක පවතින අතර පූර්ව ඇණවුම් කිරීම්වලින් 2025 වසරේ මුල් භාගයේ දී ලද තාවකාලික වාසි ක්‍රමයෙන් පහව යනු ඇතැයි අපේක්ෂා කෙරේ. භාණ්ඩ මිල ගණන් මධ්‍යස්ථ මට්ටමක පවතින අතර එය බොහෝ ආර්ථිකයන් තුළ උද්ධමන පීඩනය ලිහිල් කළ ද, සැපයුම් කම්පන හේතුවෙන් ඇති විය හැකි උද්ධමනය ඉහළ යෑමේ අවදානම් තවදුරටත් පවතී. ගෝලීය මුදල් ප්‍රතිපත්ති ලිහිල් ස්ථාවරයක් කරා යොමු වී ඇතත්, ආර්ථික වර්ධනය සහ උද්ධමන අවදානම සමතුලිත කිරීම කෙරෙහි මහ බැංකු, ආරක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කර ඇත. මේ අතර, ගෝලීය මූල්‍ය තත්ත්වයන් වර්ධනය වී ඇති නමුදු, සංවර්ධිත ආර්ථිකයන්හි පවතින ඉහළ ස්වෛරීත්ව ණය සහ අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය පීඩනය හේතුවෙන් ගෝලීය අවදානම් ඉහළ මට්ටමක පැවතුණි.

රූප සටහන 3

ගෝලීය අවිනිශ්චිතතාවය



මූලය : ගෝලීය අවිනිශ්චිතතා දර්ශක දත්ත සමුදාය*

*ගෝලීය අවිනිශ්චිතතා දර්ශක දත්ත සමුදාය H. Ahir, N. Bloom, D. Furceri. 2022. "ගෝලීය අවිනිශ්චිතතා දර්ශකය" NBER වැඩ පත්‍රිකාව 29763 හි ක්‍රමවේදය මත පදනම්ව ගොඩ නගා ඇත.

මෙම වර්ධන ප්‍රවණතා මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ සාර්ව මූල්‍ය තත්ත්වය පිළිබඳ ඉදිරි දැක්ම තරමක් සුභවාදී මට්ටමක පැවතිය ද ඒ සම්බන්ධ අවදානම් ද පවතී. දේශීය ආර්ථිකයේ පහළ ගිය උද්ධමනය, සාපේක්ෂව පහළ මට්ටමක පවතින පොලී අනුපාතික සහ රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශවල පවතින සාපේක්ෂව ශක්තිමත් ශේෂයන් යන සාධක ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පිටිවහලක් සපයයි. කෙසේ වුවද, අඩු වූ මූර්ත ආදායම, ඇතැම් අංශවල පවතින ඉහළ තෙවන අදියර යටතේ පවතින ණය සහ ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම මධ්‍යයේ විදේශ මුදල් ගලා යෑම් වැනි අභියෝග තවදුරටත් පවතී. ඊට අමතරව, ණය චක්‍රය ප්‍රසාරණය වන කාල පරිච්ඡේදයේ දී අදාළ වර්ධනයන් සමීපව නිරීක්ෂණය කිරීම මෙන්ම පූර්වගාමී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මූල්‍ය ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ද සහාය වනු ඇත. තවද, ශක්තිමත් ආර්ථික ස්වාරක්ෂක පවත්වා ගැනීම, නිසි පරිදි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හරහා ඔරොත්තු දීමේ හැකියාව පුළුල් කිරීම තුළින් හිතකර සාර්ව මූල්‍ය තත්ත්ව තහවුරු වනු ඇත.

මූල්‍ය වෙළඳපොළ

මූල්‍ය ආතති දර්ශකය[1] මගින් පිළිබිඹු වන පරිදි, දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ 2024 වසරේ අගෝස්තු මාසයේ සිට නිරීක්ෂණය වූ ආතතිය ඉහළ යෑමේ ප්‍රවණතාවෙන් මිදී 2024 වසරේ ඔක්තෝබර් මාසයේ දී තියුණු පහළ යෑමක් සනිටුහන් කළ අතර එතැන් සිට එය අඛණ්ඩව ශුන්‍යයට වඩා පහළ අගයක පැවතුණි. බැංකු අංශයේ කොටස් මිලෙහි විචල්‍යතාව අඩු වීම, රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික පහළ යෑම සහ කොටස් වෙළඳපොළ කාර්යසාධනය ඉහළ යෑම මූල්‍ය ආතති දර්ශකය පහළ මට්ටමක පැවතීම සඳහා දායක විය.

2025 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාල පරිච්ඡේදයේ දී කොටස් වෙළඳපොළ මිල දර්ශක ඉහළ යෑමේ ප්‍රවණතාවක් වාර්තා කළේය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමඟ දේශීය ආයෝජකයින් තුළ පැවති සුභවාදී අපේක්ෂාවන්, හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ආයතනික ඉපැයීම් ඉහළ යෑම මෙම වර්ධන ප්‍රවණතාවට දායක විය. විශේෂයෙන්ම සිල්ලර අංශයේ කර්මාන්තවල කාර්යසාධනය ශක්තිමත්ව පැවතුණි. කොටස් මිල එහි පොත් අගයට ඇති අනුපාතය (Price to Book Value Ratio - PBV) එම අනුපාතයෙහි දිගු කාලීන සාමාන්‍යයට ආසන්න අගයක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කොටස් මිල සහ ආයතනික ඉපැයීම් අතර අනුපාතය (Price to Earnings Ratio - PER) මධ්‍යස්ථව වර්ධනය වූ නමුත් එම අනුපාතයෙහි දිගු කාලීන සාමාන්‍යයට සහ කලාපීය රටවල්වලට වඩා පහළ අගයක පැවතුණ අතර, ආයතනික කාර්යසාධනය තිරසාරව පවත්වා ගැනීම තුළින් වෙළඳපොළ වර්ධනය සඳහා තවදුරටත් අවස්ථා පවතින බව එමගින් පෙන්නුම් කරයි. මේ අතර, වෙළඳපොළ සංවර්ධනය සඳහා නව ප්‍රාග්ධන ගලා ඒම් ආකර්ෂණය කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරමින් ශුද්ධ විදේශීය ගලා ඒම් පහත වැටුණි.

1 මෙම දර්ශකය මගින් කොටස්, දේශීය විදේශ විනිමය, රජයේ සුරැකුම්පත් සහ දේශීය මුදල් වෙළඳපොළ පිළිබඳ ආතති මනිනු ලැබේ.

රූප සටහන 4

මූල්‍ය ආතති දර්ශකය



මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය

රූප සටහන 5

කොටස් මිල දර්ශක



මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ඉහළ යෑම පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික අඩු වූ අතර සලකා බලනු ලබන කාල පරිච්ඡේදයේ දී සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ ණය නිකුත් කිරීම හේතුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර තොගය ඉහළ යෑමත් සමඟ වෙළඳපොළ මධ්‍යස්ථ වශයෙන් ප්‍රසාරණය වූ අතර, බැඳුම්කර බිල්පත් තොගය සංකෝචනය විය. රජයේ ස්වාරක්ෂක අරමුදල් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම මගින් කෙටි කාලීන ණය නිකුත් කිරීම් මත යැපීම අඩු වූ අතර එමගින් ඵලදා අනුපාතික ඉහළ යෑම සඳහා පැවති පීඩනය සීමා කරමින් ණය දීර්ඝ කර ගැනීමේ අවදානම (roll over risk) අවම කර ගන්නා ලදී. ද්විතීයික වෙළඳපොළ ද්‍රවශීලතාවට අදාළව කෙටි කාලීන කල්පිරීම් කැපී පෙනුණු අතර ඵලදා වක්‍රයෙහි දිගු කාලීන අන්තය අක්‍රියව පැවති අතර එය දිගු කාලීන සහ කෙටි කාලීන සුරැකුම්පත් අතර අධිමිල (term premium) ඉහළ යෑම සඳහා හේතු විය. රජයේ සුරැකුම්පත් සඳහා වූ විදේශ ආයෝජන ගලා ඒම ක්‍රමයෙන් වර්ධනය විය.

අන්තර් බැංකු ගනුදෙනු පරිමාව ඉහළ යෑම මෙන්ම මිලදී ගැනීමේ සහ විකිණීමේ අනුපාතික අතර පරතරය (bid-ask spread) පුළුල් වීම මගින් පිළිබිඹු වන පරිදි දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ ගියේය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ගෙවුණු අනුයාත වසර දෙකක කාලයේ දී අතිප්‍රමාණය වීමෙන් පසුව මෙම වසරේ දී මඳ වශයෙන් අවප්‍රමාණය විය. වාහන ආනයන ඉල්ලුම ද ඇතුළුව ආනයන ඉල්ලුම ඉහළ යෑම සහ බහුපාර්ශ්වීය ණය සහ මුදල් හුවමාරු (swaps) නැවත ගෙවීම මධ්‍යයේ නිල සංචිත පවත්වා ගැනීම සඳහා සහාය වෙමින් මහ බැංකුව, විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීමේ ක්‍රියාවලියේ සක්‍රියව නිරත විය. රජයට සහ පෞද්ගලික අංශයට අඛණ්ඩව විදේශ මුදල් ගලා ඒම සඳහා පවතින ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය වේ.

රූප සටහන 6

එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස්වීම්



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 7

ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ සහභාගීවන්නන්, ඇපකර සහිත ණය දීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන බව පෙන්නුම් කරමින් ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළ නිරන්තරයෙන් ඒක්ෂණ මුදල් වෙළඳපොළ අභිබවා යාමත් සමඟ ප්‍රතිමිලදී ගැනුම් සහ ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ඉහළ යෑම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ ගනුදෙනු පරිමාව ඉහළ ගියේය. දේශීය පෞද්ගලික බැංකු ශුද්ධ ණයගැතියන් වූ අතර රාජ්‍ය බැංකු ශුද්ධ ණයහිමියන් ලෙස කටයුතු කළේය. බරිත සාමාන්‍යය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍යය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ පුළුල් ලෙස සමපාතව පැවති අතර අඩු උච්චාවචනයක් සහ පරතරයක් පෙන්නුම් කෙරිණි. රජයේ ණය සේවාකරණ සහ මුදල් ආපසු ගැනීම් හේතුවෙන් ද්‍රවශීලතා අවශෝෂණයන් සිදු වුවද මහ බැංකුව ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් වෙළඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පැවතුණි.

රූප සටහන 8
දේශීය මුදල් වෙළඳපොළ පරිමාව



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්තයක් ලෙස, සලකා බලනු ලබන කාල පරිච්ඡේදයේ දී මූල්‍ය වෙළඳපොළ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ අතර මනා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුක්ත විය. ඉදිරි කාලය පිළිබඳව සලකා බැලීමේ දී, අඛණ්ඩව මෙම වර්ධනය පවත්වා ගැනීම සඳහා මෙන්ම ආයෝජක විශ්වාසය සඳහා සහාය වීමට සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම අනිවාර්ය වේ. ධනාත්මක ප්‍රවණතාවක් නිරීක්ෂණය වුවද, කොටස් වෙළඳපොළ සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ විදේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය සීමා වීම, රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු අඩු වීම සහ ගෝලීය සහ වෙළඳ අවිනිශ්චිතතා වැනි අභියෝග තවදුරටත් පවතී. මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා ස්ථාවර විදේශ විනිමය ලැබීම්, සමබර වෙළඳපොළ වර්ධනයන්, විචක්ෂණශීලී මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය අනිවාර්ය වේ. වෙනස්වන දේශීය සහ ගෝලීය ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ අවදානම් අවම කිරීමට සහ මූල්‍ය වෙළඳපොළ නිසියාකාරව ක්‍රියාත්මක වීම සහතික කර ගැනීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය සහ මනා සම්බන්ධීකරණයක් සහිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය ආයතන

2025 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ දී, මූල්‍ය ආයතන ශක්තිමත් ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළ අතර සාර්ව ආර්ථික තත්ත්වයන්හි වර්ධනය සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ඊට හේතු විය. පුද්ගලික අංශයේ ණය කැපී පෙනෙන අයුරින් ප්‍රසාරණය වීමට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දායක වූ අතර, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය එහි අවසානයට ළඟා වී තිබීම සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය වර්ධනය වීම බැංකු අංශය රාජ්‍ය අංශයට නිරාවරණය වීම අවම කිරීමට සහාය විය. පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් බොහෝ මූල්‍ය ආයතනවල ද්‍රවශීලතාව, ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව යන අංශ තවදුරටත් වැඩිදියුණු විය. මෙම ධනාත්මක වර්ධනයන් මධ්‍යයේ වුව ද, විශේෂයෙන් ණය සම්බන්ධ අවදානම් පැවතුණු අතර, එමගින් සුපරීක්ෂාකාරී අධීක්ෂණය සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගවල අඛණ්ඩ අවශ්‍යතාව පිළිබිඹු විය.

බැංකු සාධනීයත්වය පිළිබඳ දර්ශකයේ (Banking Soundness Index - BSI) ඉහළ යෑමේ ප්‍රවණතාව මගින්, සමාලෝචනය කෙරුණු කාල පරිච්ඡේදයේ දී බැංකු අංශයේ වැඩිදියුණු වූ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2025 වසරේ පළමු භාගයේ දී, පුද්ගලික අංශයට ලබාදෙන ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් ණය වර්ධනය කැපී පෙනෙන ලෙස වේගවත් වූ අතර, ඒ තුළින් බැංකු අංශය තුළ පවතින ශක්තිමත් ණය ඉල්ලුම සහ වැඩිදියුණු වූ මෙහෙයුම් කාර්යසාධනය යන තත්ත්වයන් පිළිබිඹු කෙරිණි. තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය[2] (Stage 3 Loans Ratio) පහත වැටීමත් සමඟ, වත්කම්වල ගුණාත්මකභාවය ක්‍රමයෙන් වැඩිවීමේ සලකුණු පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය ඉහළ මට්ටමක පැවතුණි. ඇතිවිය හැකි ණය අලාභ සහ ණය අවදානමට එරෙහි ස්වාරක්ෂක ශක්තිමත් කිරීම සඳහා වන පූර්වෝපායික ක්‍රියා පිළිබිඹු කරමින්, තෙවන අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණය ශක්තිමත් විය. මේ අතර, බොහෝ දුරට රජයේ සුරැකුම්පත්වල අඛණ්ඩ ආයෝජන හේතුවෙන්, රජය සමඟ බැංකු අංශයේ සමීප අන්තර්සම්බන්ධතාව අවධාරණය කරමින්, ස්වෛරීත්ව සම්බන්ධතාව (sovereign - bank nexus) සැලකිය යුතු අන්දමින් පැවතුණි. කෙසේ වෙතත්, බැංකු අංශයේ මුළු ණය කළඹෙන් ප්‍රතිශතයක් ලෙස රජයට සහ රජය සතු ව්‍යවසායන් වෙත ලබා දී ඇති ණය පහසුකම් පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත.

2 අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 (IFRS 9) රාමුව යටතේ හඳුන්වා දී ඇති තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය, අක්‍රීය ණය අනුපාතය පිළිබිඹු කරන දර්ශකයක් ලෙස සැලකිය හැකිය.

රූප සටහන 9 බැංකු අංශයේ ණය සහ ලැබිය යුතු දෑ

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 10 බැංකු අංශයේ තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය (Liquidity Coverage Ratio - LCR) මගින් පිළිබිඹු කෙරෙන බැංකු අංශයේ රුපියල් ද්‍රවශීලතාව, මූලිකවම ණය කළඹෙහි ප්‍රසාරණය හේතුවෙන් 2025 වසරේ දෙවන කාර්තුව අවසානය තුළ සුළු වශයෙන් මන්දගාමී විය. මූල්‍යන පිරිවැයෙහි සැලකිය යුතු අඩුවීම මධ්‍යයේ, ශුද්ධ පොලී ආදායමේ ඉහළ වර්ධනය හේතුවෙන්, 2025 වසරේ පළමු අර්ධයේ දී බැංකු අංශයේ ලාභදායීත්වය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. රඳවාගත් ඉපැයුම් සහ අතිරේක දෙවන ස්ථර ප්‍රාග්ධන නිකුතුවත් හරහා ශක්තිමත් අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනයේ බලපෑම මගින් 2024 වසරේ දෙවන කාර්තුවේ සිට ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව තවදුරටත් ශක්තිමත් වූ අතර, එමගින් බැංකු අංශයේ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය විය. තවද, කඩිනම් වූ ඩිජිටල්කරණය මධ්‍යයේ තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණයෙන් පැන නගින මෙහෙයුම් අවදානම්, බැංකු අංශයේ මෙන්ම සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට අභියෝග එල්ල කිරීම අඛණ්ඩව සිදු විය.

හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සහ ඉහළ යන ණය ඉල්ලුමෙහි සහාය ඇතිව, 2025 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ මුදල් සමාගම් අංශය ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළේය. වෙළඳපොළ පොලී අනුපාතික ලිහිල් කිරීම සහ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීම හේතුවෙන් 2025 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ණය වර්ධනය කැපී පෙනෙන ලෙස වේගවත් වූ අතර, එය වාහන ණය සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු විය. ගෝලීය

රූප සටහන 11 බැංකු අංශයේ බදු පසු ලාභය



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 12 බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 13
මුදල් සමාගම් අංශයේ දළ ණය සහ අත්තිකාරම්



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 14
මුදල් සමාගම් අශයේ තෙවන අදියර යටතේ පවතින ණය අනුපාත



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළෙහි රන් මිල ඉහළ යෑම මධ්‍යයේ සලකා බලනු ලබන කාල සීමාව තුළ රන් ණය පහසුකම් කෙරෙහි මෙම අංශයේ සංකේන්ද්‍රණය වීම ඉහළ ගියේය. තෙවන අදියර යටතේ පවතින දළ ණයවල පහළ යෑමක් සහ ණය කළඹෙහි ශීඝ්‍ර දියුණුවක් පිළිබිඹු කරමින් මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ ගිය අතර, එමගින් තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතිකය පහළ යන ලදී. ඒ සමඟ, තෙවන අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණය ඉහළ ගිය අතර, එමගින් ඇතිවිය හැකි ණය අවදානම්වලට එරෙහිව ස්වාරක්ෂක පවත්වා ගන්නා ලදී. මෙම කාල සීමාව මුළුල්ලෙහි අතිරික්තයක් තහවුරු කරමින් ද්‍රවශීල වත්කම් අඛණ්ඩව නියාමන සීමාවන් ඉක්මවා පැවති අතර ඒ හේතුවෙන් ද්‍රවශීලතාව ශක්තිමත්ව පැවතුණි. මූලිකවම, ඉහළ යන ණය කළඹෙන් ලැබෙන ඉහළ පොලී ආදායම හේතුවෙන්, 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මුදල් සමාගම් අංශයේ ලාභදායීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඉහළ ණය වර්ධනය හේතුවෙන් අවදානම මත බර තැබෙන වත්කම ඉහළ යෑම පදනම් කරගෙන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (Capital Adequacy Ratio - CAR) සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළ ද, මෙම අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව පුළුල් ලෙස ඔරොත්තු දිය හැකි ආකාරයෙන් පැවතුණි. මුදල් සමාගම් අංශයේ සමස්ත කාර්යසාධනය මෙම කාලය තුළ වර්ධනය වූ නමුත්, ඉහළ ණය ප්‍රසාරණයෙන් සහ ඇපකර සංකේන්ද්‍රණය වීමෙන් ඇතිවිය හැකි අවදානම් පිළිබඳ අඛණ්ඩ සුපරීක්ෂණය අත්‍යවශ්‍ය වේ.

සාමාන්‍ය රක්ෂණ අංශය යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට රක්ෂණ අංශයේ වත්කම් පදනම සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වූ අතර, දිගු කාලීන රක්ෂණ වත්කම් ද ස්ථාවරව වර්ධනය විය. කෙසේ වෙතත්, 2025 වසරේ පළමු භාගයේ දී යම් වර්ධනයක් පැවතිය ද, රට තුළ රක්ෂණ ව්‍යාප්තිය අඩු මට්ටමක පැවතුණි. සාමාන්‍ය රක්ෂණ අංශයේ බදු පෙර ලාභය ඉහළ යෑමක් වාර්තා කළ ද, මෙම අංශ දෙකෙහිම ලාභදායීත්ව දර්ශක පහළ ගියේය. සාමාන්‍ය රක්ෂණ අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සුළු වශයෙන් පහළ යෑම සිදුවුවද, අංශයේ අඛණ්ඩ ස්ථායීතාව තහවුරු කරමින්, සාමාන්‍ය සහ දිගු කාලීන රක්ෂණ යන දෙඅංශයෙහිම සමස්ත ප්‍රාග්ධන තත්ත්වයන් නියාමන අවශ්‍යතාවලට ඉහළින් පැවතුණි.

රූප සටහන 15
දළ ලියාපදිංචි වාරිකවල වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලය : ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

කුටුම්බ සහ සමාගම් අංශ[3]

වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන් සහ අඩු පොලී අනුපාතිකවල සහාය ඇතිව 2025 වසරේ පළමු භාගයේ දී කුටුම්බ[4] සහ ආයතනික[5] අංශ වෙත ලබා දුන් ණය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කුටුම්බ අංශයේ ණය ආර්ථික අර්බුදයට පෙර සමයේ පැවති මට්ටම අභිබවා යමින් 2024 වසරේ සිට අඛණ්ඩව ඉහළ යමින් පවතී. ක්‍රමයෙන් වැඩිදියුණු වූ ආර්ථික තත්ත්වයන් සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ සහාය ඇතිව කුටුම්බ අංශයේ ණය ඉල්ලුමෙහි සිදුවූ අඛණ්ඩ වර්ධනය මෙම ප්‍රවණතාව මගින් පෙන්නුම් කළේය. තවද, ආයතනික අංශයේ ණය ද 2025 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2024 වසරේ මැද භාගයේ සිට කුටුම්බ අංශයේ අක්‍රීය ණය[6] අනුපාතය ක්‍රමයෙන් පහත වැටීමක් පෙන්නුම් කළ අතර, කුටුම්බ අංශයේ සමස්ත ණයවලින් තුනෙන් එකක් පමණ වන, බැංකු නොවන මූල්‍ය ආයතන මගින් ලබා දුන් ණය හා සම්බන්ධ අක්‍රීය ණය අනුපාතයෙහි ද සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, ආයතනික අංශය ද, 2025 වසරේ පළමු භාගයේ දී පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව අක්‍රීය ණය අනුපාතිකයේ පහළ යෑමක් වාර්තා කිරීමට සමත් විය. ඉදිරි කාලය සලකා බැලීමේ දී, පවත්නා හිතකර පොලී අනුපාතික සහ සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සහායෙන් කුටුම්බ සහ ආයතනික අංශයේ ණය වර්ධනය වීම සඳහා තවදුරටත් ඉඩ ප්‍රස්ථාව පවතින බව දක්නට ලැබේ. ඊට අමතරව, දේශීය සාර්ව ආර්ථික තත්ත්වවල සිදුවන යථා තත්ත්වයට පත්වීමට සමගාමීව කුටුම්බ සහ ආයතනික අංශවල ණය ආපසු ගෙවීමේ හැකියාව වර්ධනය වීම අඛණ්ඩව සිදුවන බැවින් දෙඅංශයේම අක්‍රීය ණය අනුපාත තවදුරටත් පහළ යනු ඇත.

ආර්ථිකයේ මූල්‍ය සේවාවන් ලබා ගන්නා ප්‍රධානම පාරිභෝගිකයකු වන ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් (Listed Non Financial Corporates - NFCs), පෙර වසරවල් හා සැසඳීමේ දී 2025 වසරේ පළමු භාගයේ දී සමස්ත කාර්යසාධනයේ වර්ධනයක් වාර්තා කළේය. ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල ආදායමෙහි මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා වූ අතර, ලාභදායීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය විය. වෙළඳපොළ තුළ පැවති අඩු පොලී අනුපාතික සහ වැඩිදියුණු වන සාර්ව ආර්ථික තත්ත්ව ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල ලාභදායීත්වය වර්ධනය වීම සඳහා සහාය විය. තවද, දළ ලාභ සහ වෙනත් ආදායම් ද ලාභදායීත්වය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක විය. ඉහළ ලාභදායීත්වයේ සහාය ඇතිව වැඩිදියුණු වූ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබිඹු කරමින්, මෙම කාලය තුළ සෑම අංශයකම පාහේ පොලී ආවරණ අනුපාතය එකට වඩා ඉහළ අගයක පැවතුණි. ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල වැඩිදියුණු වූ ණය ආපසු ගෙවීමේ හැකියාව, මෙම අංශයට නිරාවරණය වූ මූල්‍ය ආයතනවල වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු

3 මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති දත්ත, ණය තොරතුරු කාර්යාංශය (CRIB) සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) මගින් ලබා ගත් දත්ත මත පදනම් වේ. එම නිසා, මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති දත්ත, FinNet දත්ත මත පදනම් වූ මූල්‍ය ආයතන පිළිබඳ කොටස සමග ඍජුවම සංසන්දනය කළ නොහැකි ය.

4 ණය තොරතුරු කාර්යාංශය වෙතින් ලබාගත් සමස්ත ණය දත්ත මත පදනම්ව, මෙම විශ්ලේෂණයේ ඉදිරිපත් කර ඇති කුටුම්බ අංශයේ ණය, ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය හරහා හඳුනාගත් පුද්ගලයින් විසින් ලබාගත් ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වන අතර, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අනුව ව්‍යාපාරික කටයුතු සඳහා කුටුම්බ විසින් ලබා ගන්නා ණය ගැනීම් ද ඇතුළත් විය හැකිය.

5 ආයතනික අංශයේ ණය අතරට ව්‍යාපාරික ආයතන ලෙස ලියාපදිංචි කර ඇති ආයතන විසින් ලබා ගන්නා ණය සහ අත්තිකාරම් සහ රජය සතු ව්‍යාපාර ව්‍යවසායන් සහ රජයට ලබා දෙන ණය පහසුකම් ඇතුළත් වේ.

6 මෙම විශ්ලේෂණය මගින් දින 90ට වඩා හිඟ ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරයි.

රූප සටහන 16 කුටුම්බ අංශයේ ණය



මූලය : ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 17 කුටුම්බ අංශයේ අක්‍රීය ණය අනුපාත



මූලය : ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 18 මූල්‍ය නොවන සමාගම්වල ආදායම සහ ආදායමෙහි වර්ධනය



රූප සටහන 19 මූල්‍ය නොවන සමාගම්වල ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක



ඇතැයි අපේක්ෂා කරන අතර, එය සමස්ත මූල්‍ය ස්ථායිතාව සඳහා දායක වනු ඇත. තවද, මහ බැංකුව මගින් සිදු කළ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් පිළිබිඹුවන පරිදි, ව්‍යාපාර අපේක්ෂා සහ ඒ හා සම්බන්ධ ඉදිරි දැක්ම, 2025 වසරේ පළමු භාගය පුරාම ධනාත්මකව පැවතුණි. මෙම හිතකර තත්ත්වයන් ඉදිරි කාලයේදී ද පැවතුණහොත්, ඒවා මූල්‍ය නොවන සමාගම්වල කාර්යසාධනය සහ ණය ආපසු ගෙවීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

මූල්‍ය ස්ථායිතාව සඳහා ප්‍රතිපත්ති

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, මහ බැංකුව සිය සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කළ අතර, එමගින් මූල්‍ය පද්ධති ස්ථායිතාව ආරක්ෂා කර ගැනීමට සහ පවත්වාගෙන යෑම සඳහා සහාය විය. 2025 වසරේ අප්‍රේල් මාසය තුළ දී, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (D-SIBs) නාමනය කිරීමේ නිර්ණායක යාවත්කාලීන කෙරිණි. ඒ අනුව, නියමිත නිර්ණායක මත පදනම්ව, මහ බැංකුව විසින් එවැනි බලපත්‍රලාභී බැංකුවල අලාභ දරාගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමට සහ එමගින් අහිතකර කම්පනවල දී ඒවායේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු පහක් නම් කරන ලදී. පද්ධතිමය වශයෙන් වැදගත්කමක් ඇති දේශීය බැංකු සමාලෝචනය කිරීම වාර්ෂිකව සිදුකෙරෙන අතර සෑම වසර තුනකට වරක්ම විස්තීර්ණ ඇගයීමක් සිදු කරනු ලබයි. මේ අතර මහ බැංකුව, සාර්ව විචක්ෂණ අරමුණු ළඟා කරගැනීමේ දී ඵලදායීත්වය වැඩිදියුණු කිරීම සහ විචක්ෂණශීලී ණය ප්‍රමිති ශක්තිමත් කිරීම අරමුණු කරගෙන මෝටර් රථ වාහන සම්බන්ධ ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය ලබාදීමේ (Loan to Value Ratio - LTV) අනුපාතයන්හි උපරිම සීමාවන් ද සංශෝධනය කළේය. මෙම සංශෝධන මගින්, විවිධ සාර්ව විචක්ෂණ නොවන අරමුණු සඳහා, පෙර හඳුන්වා දුන් වටිනාකම මත ණය ලබාදීමේ අනුපාතවල උපරිම සීමාවන්හි පැවති විෂමතා ඉවත් කිරීම ද අරමුණු විය.

මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රතිපත්ති

මෙම සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිවලට අමතරව, මහ බැංකුව, සමස්ත මූල්‍ය පද්ධති ස්ථායිතාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දුන්නේය. ඒ අනුව, මහ බැංකුව රාජ්‍ය බැංකු ඇතුළුව සියලුම බලපත්‍රලාභී බැංකුවල පාලන ක්‍රියාවලීන් සහ භාවිතාවන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා 2024 සැප්තැම්බර් මාසයේ දී "බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලනය" සම්බන්ධයෙන් විධාන නිකුත් කළේය. එහි අරමුණ වූයේ බැංකු ව්‍යාපාර කටයුතු වගකීමෙන් හා වගවීමෙන් සිදුකිරීම සඳහා පහසුකම් සැලසීම තුළින් මූල්‍ය පද්ධතියේ සහ බැංකු අංශයේ ආරක්ෂාව සහ ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීමයි. මේ අතර, මුදල් සමාගම් අංශයේ අවදානම් කළමනාකරණ භාවිතාවන් වර්ධනය සඳහා ප්‍රමිති සකස් කිරීම අරමුණු කරගෙන, මුදල් සමාගම් සඳහා වන නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කෙරිණි.

රූප සටහන 20

2015 වසරේ සිට වටිනාකම මත ණය ලබාදීමේ රාමුවෙහි ගමන් මග



වගුව 1

මෝටර් රථ වාහන මිලදී ගැනීම සම්බන්ධයෙන් වන වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය සඳහා වන උපරිම සීමා

වාහන කාණ්ඩය		මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණයට අනුකූලව වාහන පන්තිය	වටිනාකම මත ණය ලබාදීමේ අනුපාතය
ලියාපදිංචි නොකළ සහ ශ්‍රී ලංකාව තුළ වසරකට වඩා අඩු කාලයක් භාවිතා කළ ලියාපදිංචි වාහන	වාණිජ වාහන	C1, C, CE, D1, D, DE,G1, G, J සහ B කාණ්ඩයන් යටතේ වර්ගීකරණය කරන ලද සැහැල්ලු ට්‍රක් රථ	80%
	මොටර් කාර්, SUV සහ වෑන් රථ	B (සැහැල්ලු ට්‍රක් රථ සහ තනි කැබ් රථ හැර)	60%
	ත්‍රිරෝද රථ	B1	50%
	ඉහත කාණ්ඩවලට අයත් නොවන අනෙකුත් වාහන	A1, A සහ B කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද තනි කැබ් රථ	70%
ශ්‍රී ලංකාව තුළ වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ ලියාපදිංචි වාහන (බැංකු සහ මුදල් සමාගම් යන දෙඅංශය සඳහා)			70%

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, 2023 අංක 17 දරණ බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි ආවරණය මුදල් සමාගම් දක්වා පුළුල් කිරීම හරහා නිරාකරණ ප්‍රතිපත්ති, මෙහෙයුම් අත්පොත් සැකසීම, සහ කාලීන මැදිහත්වීම තහවුරු කිරීම සහ මූල්‍ය පද්ධති විෂමතා අවම කිරීමට නිරාකරණ ප්‍රේරක ස්ථාපිත කිරීම මගින් රටේ නිරාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කෙරිණි. තවද, මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසයට බලපෑම් ඇති කළ හැකි මූල්‍ය වංචා, සයිබර් තර්ජන වැනි ඉහළ යන අවදානම්වලට ප්‍රතිචාර වශයෙන්, මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ඩිජිටල් ගෙවීම්වල ආරක්ෂාව වැඩිදියුණු කිරීමෙන් මහ බැංකුව, මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා පූර්වෝපායික ක්‍රියාමාර්ග ගනු ලැබීය. සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, මහ බැංකුව මගින් නියාමනය වන මූල්‍ය ආයතනවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීමට සිය වෙළඳපොළ මෙහෙයුම් අධීක්ෂණ ක්‍රමය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළ අතර තහනම් පිරමීඩ ක්‍රමවලට එරෙහිව ගත් පියවර තවදුරටත් තීව්‍ර කරන ලදී. එයට අමතරව, මහ බැංකුව, තොරතුරු සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම, ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ ක්‍රමවේදය

ශක්තිමත් කිරීම, ජනාධිපති නියමයන් යටතේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යසාධක බලකාය ප්‍රතිසංවිධානය කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ සමපාත වීම සඳහා නෛතික සංශෝධන ක්‍රියාත්මක කිරීම සහ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානමට පිළියම් යෙදීම තුළින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම ද සිදු කරන ලදී. තවද, මහ බැංකුව, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය සහ සාක්ෂරතාවය දියුණු කළ අතර, විවිධ පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් මූල්‍ය සාක්ෂරතා පෙරදැක්ම ක්‍රියාවට නංවන ලද අතර එමගින් දැනුම මත පදනම් වූ මූල්‍ය සහභාගීත්වය ප්‍රවර්ධනය සඳහා ඉලක්කගත මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. එයට අමතරව, තිරසර මූල්‍ය පෙර දැක්ම 2.0 දියත් කිරීම සහ ඒ සම්බන්ධ ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් මගින් රටේ පාරිසරික සහ සමාජ ඉලක්ක සමඟ මූල්‍ය ආයතන සමපාත වීමට මඟ පෙන්වූ අතර, මූල්‍ය පද්ධතියේ තිරසරබව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කෙරිණි.

රට පෙර නොදුටු විරූ ආර්ථික අර්බුදයකින් ගොඩ ඒමත් සමඟ, පුද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රවාහ ඉහළ යෑම අපේක්ෂා කරනු ලබයි. එමගින් ණය චක්‍රයේ ප්‍රසාරණ අවධිය තවදුරටත් දිගු විය හැකි අතරම ගොඩනැගෙන සුභවාදී විශ්වාස මත පදනම්ව අවදානම් ගැනීම ඉහළ යා හැකි බැවින්, මහ බැංකුව මෙම ණය වර්ධනය සමීපව නිරීක්ෂණය කරනු ඇත. එයට අමතරව, භූ දේශපාලනික ගැටුම් මධ්‍යයේ රන් වැනි ආරක්ෂිත වත්කම්වල ගෝලීය මිල ඉහළ යෑම සහ ආනයන ලිහිල් කිරීම තුළින් මෝටර් රථ වාහන සඳහා වන ඉල්ලුම වර්ධනය වීම, එවැනි වත්කම් මගින් ඇපකර සපයා ඇති ණය සහ අත්තිකාරම් සඳහා බලපෑම් ඇති කළ හැක. මූල්‍ය පද්ධතියේ අඛණ්ඩ ස්ථායීතාව තහවුරු කරමින්, ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට සහ සුදුසු සාර්ව විචක්ෂණතා සහ ක්ෂුද්‍ර විචක්ෂණතා ක්‍රියාමාර්ග නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට, මහ බැංකුව මූල්‍ය අංශයේ අනෙකුත් නියාමන අධිකාරීන් සමඟ එක්ව මෙම වෙළඳපොළ ප්‍රවණතා මෙන්ම ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන්හි මෙකී වර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සිදු කරයි.